# 15 ආශිර්වාදකාර බන්ධනය

## ආශිර්වාදකාර බන්ධනයේ ප්‍රසාද නිධානය :



15.1 රූපය - ආශිර්වාදකාර බන්ධන පිළිවෙත

"දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා!

(මාක් 10:9)

විවාහය යනු ස්වාමි පුරුෂයා හා භාර්යාව එකිනෙකාට අන්‍යෝන්‍ය ව කැපවෙන අවලංගු කළ නොහැකි ගිවිසුමකි. ස්ත්‍රියක හා පුරුෂයකු නිදහස් කැමැත්තෙන් ඇතුළු වන මෙම ගිවිසුම යාවජීව සහකාරකමකි (මතෙව් 19:6). එම නිසා එක් පාර්ශවයක් හෝ දෙදෙනා ම හෝ කුමන අවස්ථාවක දී හෝ එම කැමැත්ත අස්කර ගත්තත් විවාහ ගිවිසුම එලෙස ම පවතියි.

කිතුනු විවාහයේ ලක්ෂණ 2කි.

- ඒකත්වය
- අඛණ්ඩත්වය

ඒකත්වය යනු එක් ස්වාමි පුරුෂයෙකුට එක් භාර්යාවක ද එක් භාර්යාවකට එක් ස්වාමි පුරුෂයෙකු ද පමණක් විවාහ කර ගත හැකි බව ය.

අඛණ්ඩත්වය යනු කිතුනු විවාහයක් දික්කසාද කළ නොහැකි බව ය.

**කිතුනු විවාහයේ පරමාර්ථ**

අන්‍යෝන්‍ය සහයෝගය හා ප්‍රේමය තුළ පරිපූර්ණත්වයට පත්වීම

ජීවිතාන්තය දක්වා ම පවත්වා ගෙන යන සබඳතාව සමාන කළ හැක්කේ ක්‍රිස්තුන් වහන්සේ ස්වකීය සභාව හා සමග පවත්වා ගෙන යන සබඳතාවට ය. එම සබඳතාව ගොඩනගා ගන්නේ දෙදෙනා එකිනෙකා වෙත දක්වන ආදරය මගිනි. එම ආදරය දිනෙන් දින වර්ධනය කරගත යුතු ය.

දරුවන් ජනනය හා ඇති දැඩි කිරීම

තමන්ට ලැබෙන දරුවන් සතුටින් බාරගෙන ඔවුන්ට ආදරය, රැකවරණය, පෝෂණය, ක්‍රිස්තියානි හැදියාව හා අධ්‍යාපනය ලබා දීම විවාහයේ පරමාර්ථයකි.

දරු සම්පත සමිඳාණන්ගෙන් ලැබෙන දයාදයකි. ඒ සම්පත එතුමන්ගෙන් ලැබෙන ඉමහත් ආශිර්වාදයකි.
(ගීතාවලිය 127:3)

## කතෝලික විවාහයට ඇති නීත්‍යානුකූල බාධා

- **වයස** :- අවුරුදු 18 සම්පූර්ණ විය යුතු ය. අවුරුදු 23-29 අතර විවාහ වීම නිරෝගී දරුවන් බිහි කිරීමට පිටිවහලකි.
- **නිදහස් කැමැත්ත** :- තමන් අකමැති පුද්ගලයකු හා විවාහ වන ලෙස බල කළ නොහැකි ය.
- **අපරාධ** :- යමෙක් යම් පුද්ගලයකු හා විවාහ වීමේ අදහසින් එම පුද්ගලයාගේ ස්වාමි පුරුෂයා ව හෝ භාර්යාව හෝ තමාගේ ස්වාමි පුරුෂයා ව හෝ භාර්යාව හෝ ඝාතනය කළහොත් එම පුද්ගලයා සමග වලංගු විවාහයකට ඇතුළත් විය නොහැකි ය.
- **ලේ නෑකම්**
- **මිශ්‍ර විවාහ**

## විවාහ පොරොන්දුව

විවාහයේ බාහිර සලකුණු වනුයේ විවාහ පොරොන්දුව යි.

.......... වන මම ....... වන ඔබ, මාගේ භාර්යාව/ස්වාමි පුරුෂයා කොට භාර ගනිමි. වාසනාවත් කල්හි ද, අවසානාවත් කල්හි ද ලෙඩ දුකේ දී හා සුව සැපේ දී ද ඔබට විශ්වාසවන්ත වන්නට මම පොරොන්දු වෙමි. මාගේ මුළු ජීවිත කාලය තුළ දී ම මම ඔබට ප්‍රේම කරමි; මම ඔබට ගෞරව කරමි.

ආශිර්වාදකාර බන්ධනය දානය කරනු ලබන්නේ විවාහ අපේක්ෂක යුවළ විසින් එකිනෙකාට ය. පූජාප්‍රසාදිතුමා සභාවේ නිල සාක්ෂිකරුවා ය. එතුමා ක්‍රිස්තුන් වහන්සේගේ දෘෂ්‍යමාන නියෝජිතයා වශයෙන් දෙවියන් වහන්සේගේ ආශිර්වාදය දානය කරයි. එබැවින් විවාහය දෙවි සමිඳුණන් ඉදිරියේ සිදුවන උත්තරීතර එක්වීමකි (කොරි 7:10).

ප්‍රසාද ස්නාපනය ලැබූ දෙදෙනෙකු අතර සිදු වන විවාහ ගිවිසුම දේව ප්‍රසාද නිධානයකි. එවැන්නක් අවලංගු කළ නොහැකි ය.

මිනිසෙක් තමාගේ පියා ද මව ද අතහැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දෙදෙනා එක් කෙනෙක් වන්නෝ ය. මෙය මහා අභිරහසකි. මට හැඟෙන පරිදි එය අදාළ වන්නේ ක්‍රිස්තුන් වහන්සේට සහ සභාවට ය. එහෙත් එය පෞද්ගලික වශයෙන් ඔබටත් අදාළ වන්නේ ය. හැම පුරුෂයෙකු ම තමාට මෙන් තම භාර්යාවට ප්‍රේම කළ යුතු ය. හැම භාර්යාවක් ම තම ස්වාමි පුරුෂයාට ගෞරව දැක්විය යුතු ය.

(එපීස 5:31-33)

## ආශිර්වාදකාර බන්ධනය හා සිවිල් නීතිය

ශ්‍රී ලංකා ජනරජයේ නීතිරීති අනුව සියලු ම විවාහ රජයේ ලියාපදිංචි කළ යුතු ය. මේ අනුව දේවස්ථානවල පැවැත්වෙන කතෝලික විවාහ ද රජයේ ලේඛනවල ලියාපදිංචි කරනු ලැබේ. එසේ කරනු ලබන්නේ මිසම් භාර පියතුමන් විසිනි. එතුමන්ට රෙජිස්ටාර් වශයෙන් ක්‍රියා කරන්නට අවසරය ලැබී ඇත. මෙම ලියාපදිංචි කිරීම දේව ප්‍රසාද නිධානයට අදාළ වන්නේ නැත. එය වැදගත් වන්නේ සිවිල් අයිතිවාසිකම් සඳහා පමණි. රජයේ ලියාපදිංචි වී ඇතත් නැතත් දේවස්ථානයක සිදු කරන විවාහ, දේව ප්‍රසාද නිධානයක් සැටියට සඳහටම වලංගු ය. එහෙත් රජයේ නීති රීති උල්ලංඝනය නොවන පිණිසත් තමන්ගේ දේපළ ඉඩකඩම් පිළිබඳ අයිතිය සුරකෙන පිණිසත් රජයේ ලියාපදිංචි කළ යුතු ය. කතෝලික නොවන පූජකවරයකු ඉදිරියේ හෝ රෙජිස්ටාර්වරයකු ඉදිරියේ හෝ විවාහ වීමට කතෝලිකයනට අවසර නොමැත. එවැනි විවාහයක් දේව ප්‍රසාද නිධානයක් නොවේ.

## දික්කසාදය හා අවලංගු විවාහ

කතෝලික සභාව තුළ දික්කසාදයක් නොමැත. මන්ද වලංගු විවාහයක් අවලංගු කිරීමේ හැකියාව ශුද්ධ වූ සභාවට පවා නොමැත. එය දෙවියන් වහන්සේ ඉදිරියේ කළ ගිවිසුමකි. එහෙත් ඇතැම් අවස්ථාවල දී සභා අධිකරණයක දී කරන විභාගයක් අවසානයෙහි ඇතැම් විවාහ සිදු වී නොමැති බවට ප්‍රකාශ කරයි. එසේ ප්‍රකාශ කරන්නේ නිදහස් කැමැත්ත නොමැති ව සිදුකළ විවාහ සම්බන්ධයෙන් හා විවාහයට නීත්‍යානුකූල බාධාවක් පවතින විට එයට නිසි අවසරයක් නොගෙන කළ විවාහ සම්බන්ධයෙන් පමණි.

කතෝලික විවාහ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා;

- ⋆ දෙදෙනා ම කතෝලිකයන් වීම
- ⋆ අන්‍යෝන්‍ය ප්‍රේමය හා විශ්වාසය
- ⋆ පිරිසිදු චරිතය
- ⋆ අවබෝධය හා තේරුම් ගැනීම
- ⋆ පරිත්‍යාගය
- ⋆ පවුලේ සාමූහිකත්වය වෙනුවෙන් කටයුතු කිරීම වැදගත් ය.
- ⋆ විවාහ ජීවිතයේ වගකීම් වෙත ආධ්‍යාත්මික ප්‍රවේශය

මෙසේ ඔව්හු එවක් පටන් දෙදෙනකු නොව එක් කෙනෙක් වෙති.

(මතෙව් 19:6)

**ක්‍රියාකාරකම**

1. රජයේ විවාහ නිලධාරියකු හමුවේ විවාහ වීමට යන කතෝලිකයකුට ඔබ දෙන උපදේශය කුමක්දැයි පැහැදිලි කරන්න.
2. සාර්ථක කතෝලික විවාහයක් සඳහා අවශ්‍ය වන දෑ පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න.



**ජීවිතයට බිඳක්**

***පාසල් යන කාලය තුළ ප්‍රේම සබඳතා ඇති කර නොගනිමු.***